# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## 2016 සැප්තැම්බර් මස 02 වන දින

## II වන කොටස

## අතිරේකය

**(2016.09.02 දින නිකුත් කරන ලදී)**


# ඉඩම් (සන්තකය පැවරීම සීමා කිරීමේ) (සංශෝධන)

**2014 අංක 38 දරන ඉඩම් (සන්තකය පැවරීම සීමා කිරීමේ) පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.**

මුදල් අමාත්‍යතුමාගේ නියමය පරිදි පළ කරන ලදී.


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක.

මිළ : රු. 6.00 යි. තැපැල් ගාස්තුව : රු. 10.00 යි.

**නීතිය බලපෑමේ ප්‍රකාශය**

***2 වන වගන්තිය*** : මේ වගන්තිය මගින් 2014 අංක 38 දරන ඉඩම් (සන්තකය පැවරීම සීමා කිරීමේ) පනතට අළුත් 5අ වගන්තිය ඇතුළත් කරනු ලබන අතර, සංශෝධිත පරිදි වගන්තියේ නීතිය බලපෑම වනුයේ 2016 ජනවාරි මස 1 වන දින සිට බලාත්මක වන පරිදි ඉඩම් බදුකරණ බද්ද අයකිරීම නතර කිරීම වේ.

## ඉඩම් (සන්තකය පැවරීම සීමා කිරීමේ) (සංශෝධන)

එල්.ඩී.—ඕ. 14/2016.

### 2014 අංක 38 දරන ඉඩම් (සන්තකය පැවරීම සීමා කිරීමේ) පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වීමේ දිනය.

**1.** මේ පනත 2016 අංක දරන ඉඩම් (සන්තකය පැවරීම සීමා කිරීමේ) (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, එය 2016 ජනවාරි මස 1 වන දින සිට ක්‍රියාත්මක වූ ලෙස සලකනු ලැබිය යුතු ය.

2014 අංක 38 දරන පනතට 5අ වගන්තිය ඇතුළත් කිරීම.

**2.** 2014 අංක 38 දරන ඉඩම් (සන්තකය පැවරීම සීමා කිරීමේ) පනතේ 5 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ඒ පනතේ "5අ" වගන්තිය ලෙස බලපැවැත්විය යුතු යː-

"2016 ජනවාරි මස 1 වන දින සිට බලපැවැත්වෙන පරිදි ඉඩම් බදුකරණ බද්ද අයකර ගනු නොලැබිය යුතු බව.

5අ. මේ පනතේ වෙනත් යම් විධිවිධානයක පටහැනිව කුමක් සඳහන් වුව ද, යම් ඉඩමක් -

(අ) විදේශිකයකුට; හෝ

(ආ) සමාගම් පනත යටතේ ශ්‍රී ලංකාවේ සංස්ථාගත කරන ලද, විදේශීය කොටස් හිමිකාරිත්වය සෘජුව හෝ වක්‍රව සියයට පනහක් හෝ ඊට වැඩි සමාගමකට; හෝ

(ඇ) විදේශීය සමාගමකට,

2016 ජනවාරි මස 1 වන දින හෝ එදිනට පසුව එළඹෙන ලද බදු ගිවිසුමක් යටතේ බද්දට දීමේ දී ඉඩම් බදුකරණ බද්දට අදළ විධිවිධාන අදළ නොවිය යුතු අතර, ඒ අනුව ඒ දිනයේ දී හෝ එදිනට පසුව

2—PL 010173—450 (2016/08)

එවැනි යම් තැනැත්තකුගෙන් හෝ සමාගමකින් ඉඩම් බදුකරණ බද්ද අයකර ගැනීම හෝ රැස් කිරීම නොකළ යුතු ය.”.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

3. මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 875 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළෙඹන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකි ය.